**බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

---------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 31 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගන්නා ලද රු.252,550 ක් වටිනා ස්ථාවර වත්කම් ගිණුම්ගතවී නොතිබුණි.

(ආ) ජංගම වත්කම් යටතේ දැක්විය යුතු රු.287,164 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 3 ක් වෙනුවෙන් ණයහිමි වටිනාකම රු. 1,412,987 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාල ණයහිමියෝ රු.112,313 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය තුළ ඇතුළත්වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණය හිමියන් ලෙස දක්වා ඇති එකතුව රු. 55,473 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) රු.37,812 ක සේවක ඇප තැන්පත් ගිණුම්ගතවී නොතිබුණි.

(උ) 2016 වර්ෂයේ ලංකා බැංකුවේ ඇති ස්ථාවර තැන්පත් වෙනුවෙන් ලැබිය යුතු පොලී රු.11,700 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඍ) 2016 දෙසැම්බර් 31 හිඟ හිටි වරෙන්තු හා දඩ මුදල් රු.434,326 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඒ) ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා තිබූ පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු ප්‍රවර්තන වර්ෂයේ දී නිවැරදි කර නොතිබුණි.

(i) ඉදිකිරීම් කර්මාන්ත 06 ක් වෙනුවෙන් ලැබිය යුතු වටිනාකම දෙවරක් ණයගැතියන් ලෙස වෙන්කිරීම.

(ii) කර්මාන්ත 07 ක් වෙනුවෙන් ගෙවිය යුතු වටිනාකම දෙවරක් ණයහිමියන් ලෙස වෙන්කිරීම.

(iii) ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ පවත්නා ස්ථාවර තැන්පත් වෙනුවෙන් ලැබිය යුතු පොලී ආදායම රු.46,387 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම.

(iv) උසාවි දඩ ආදායම රු.157,707 ක් අඩුවෙන් දක්වා තිබීම.

1.3.2. **නොසැසඳූ පාලන ගිණුම්**

---------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂයන් හා අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳීමේ දී වටිනාකම රු. 8,012,596 ක වෙනසක් නිරූපනය වී තිබුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 16,076,980 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 14,588,935 ක් විය.

1.3.4 **විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොවීම**

---------------------------------------------

රු.10,899,552 ක් වටිනා ගිණුම් විෂයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

--------------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතිරීති, රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලැබූ හා සේවය හැර ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 311,934 ක් වූ සේවක ණය අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | 1990 ඔක්තෝබර් 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 41/90 | ප්‍රාදේශීය සභාව සතු වාහන 07 කට අදාලව ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | 1980 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තිය | පරිසර බලපත්‍ර ලබාගත යුතු ක්‍රියාවලීන් විධිමත් සමීක්ෂණයක් මඟින් හඳුනාගෙන නොතිබුණු අතර, ව්‍යාපාර 30 ක් සඳහා පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබුණි. |

### 1.3.6 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2016 අගෝස්තු 13 දිනැති ඌව පළාත් සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ අංක B/ACLG/03/02 (අ.ඉ) දරන ලිපිය හා 2015 ජුනි 03 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක 12/1/1 දරන සභා බලතල පැවරීම් සම්බන්ධ ලිපියේ 02 (vii) හි සඳහන් විධිවිධාන වලට පටහැනිව අනුමත ඉන්ධන ප්‍රමාණය ඉක්මවා භාවිතා කර තිබූ රු.81,320 ක් වටිනා ඉන්ධන ලීටර් 856 ක් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,002,360 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,431,704 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල අක්කර බදු ආදායමින් රැස්කිරීමේ ප්‍රතිශතය සියයට 36 ක් වූ බැවින් ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොපවතින බව නිරීක්ෂණය විය.

2.2.2 **වෙනත් ආදායම්**

-----------------

සභා බල ප්‍රදේශය තුළ සම්ප්‍රේෂණ කුළුණු පහක් පවත්වාගෙන යාම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණද, ඒ සඳහා ගාස්තු අයකිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

සමාලෝචිත වර්ෂය තුලදී උසාවි දඩ වෙනුවෙන් රු.5,221,457 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.5,310,593 ක් පළාත් සභාවෙන් අයකර ගැනීමට තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ රජයේ දේපල ණය සඳහා පොලී දායකය වෙනුවෙන් සභාව අදාල බැංකු වෙත ප්‍රේෂණය කර ඇති රු.172,804 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

බැකෝ යන්ත්‍රය බාහිර පාර්ශවයන්ට කුලියට දීමෙන් රු.11,700 ක හිඟ කුලී ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

----------------------------------------

4.1 **අයවැය පාලනය**

-----------------

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

-----------------------

2016 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

------------------------------------------------------

ප්‍රවර්තන වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) තොග පාලනය
(ඈ) ආදායම් අයකර ගැනීම
(ඉ) වාහන පාලනය
(ඊ) මිලදී ගැනීම